**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

| | | |
|---|---|---|
| **මගේ අංකය** / எனது இல. / My No. | **ඔබේ අංකය** / உமது இல. / Your No. | **දිනය** / திகதி / Date: 2022-12-21 |

පැමිණිලි පාර්ශවය : එච්.කේ. රෂින්ත තුෂාර මහතා,
ජතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය,
අංක : 15, කාකදූපත,
මට්ටක්කුලිය, කොළඹ 15.

වගඋත්තර පාර්ශවය : අධ්‍යක්ෂ ජනරාල්,
ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය,
මට්ටක්කුලිය,
කොළඹ 15.

<u>පැමිණිලි අංකය</u> : **<u>HRC/3649/11</u>**

**පැමිණිල්ල :-**

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් පහත සඳහන් කරුණු ඉදිරිපත් කොට ඇත.

තමා 2000 අප්‍රේල් මස අභ්‍යාසලාභී උපාධිධාරියෙකු ලෙස වගඋත්තරකාර ආයතනයට බැඳුනු බවත්, 2001.05.02 දින සිට විද්‍යාල උපදේශක වශයෙන් ස්ථිර කරන ලද බවත්, එදින සිට වසර 8ක පමණ කාලයක් ගතවනතුරු එකම තනතුරෙහි කිසිදු ශ්‍රේණිගත කිරීමකට ලක්නොවෙමින් අනිකුත් සියළුම විද්‍යාල උපදේශකවරුන් සමඟ ආයතනය තුළ සේවය කළ බවත්, 2009 වර්ෂයේදී තම අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් මත ආයතනය තුළ වෙනමම බඳවා ගන්නා ලද නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරකට අයදුම්පත් යොමු කිරීමෙන් පසු එකී තනතුරට පත්වී මේ දක්වා සේවය කරන බවත් දන්වා ඇත.

නමුත්, පසු කාලීනව විද්‍යාල උපදේශක තනතුරෙහි සිටි කිසිදු නිලධාරින් උසස්වීමක් හෝ ශ්‍රේණිගත කිරීමක් නොලබා දීර්ග කාලයක් පුරා එම තනතුරෙහි රැඳී සිටීම හේතුවෙන් එම නිලධාරීන් වෙනුවෙන්



**ප්‍රධාන කාර්යාලය** / பிரதான அலுவலகம் — **14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04.** / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04.
**සභාපති** / தவிசாளர் — 011-2505451
**ෆැක්ස්** / தொலைநகல் — 011-2505541/ 74
**ඊමේල්** / மின்னஞ்சல் — sechrcsl@gmail.com

ක්‍රියාත්මක වන පරිදි ඔවුන් ඇගයීමකට ලක් කර ශ්‍රේණිගත කොට 2007 වසරේ සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රේණියට අදාළ වැටුපෙහි පිහිටුවා සාධාරණයක් ඉෂ්ඨ කොට ඇති බවද දක්වා ඇත. නමුත් පැමිණිලිකාර තමාද අදාළ සම්පූර්ණ කාල වකවානුව තුළ විද්‍යාල උපදේශකවරයෙක් වශයෙන් එම අසාධාරණයටම ලක්වූ නමුත්, තමා සම්බන්ධයෙන් ඉහත ශ්‍රේණිගත කිරීම සිදු නොකළ බව දන්වා ඇත.

ඉහත කරුණු තුළ එකම අසාධාරණයට ලක්වූ පිරිසක් අතරින් අන් සියළු දෙනාට සහන සලසා දීමත් තමාට පමණක් සමසේ නොසැලකීමත් මඟින් තම මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වූ බවට කොමිෂන් සභාව හමුවේ පැමිණිලි කොට ඇත.

**වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-**

ඉහත පැමිණිල්ල සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරමින් වගඋත්තර පාර්ශවය සඳහන් කර ඇත්තේ, 2001 වර්ෂයේ සිට "විද්‍යාල උපදේශක" තනතුර යටතේ ආයතනයට බැඳුනු විශාල පිරිසක් කිසිඳු උස්වීමක් නොමැතිව 2010 වසර දක්වා එකම තනතුරේ එකම ශ්‍රේණියේ සේවය කළ බවත්, මෙම තත්ත්වය අවබෝධ කොට ගැනීමෙන් පසු පාලක සභාව විසින් විශේෂ කමිටුවක් පත්කොට එම පිරිසට උසස්වීම් ලබාදීම සම්බන්ධයෙන් සලකා බැලූ බවත්, ඒ අනුව 2001 වසරේ සිට 2010 වසර දක්වා එකම ශ්‍රේණියේ සිටි සියළුම සේවකයන් සම්මුඛ පරීක්ෂණයකට ලක්කොට සුවිශේෂී කාර්ය සාධනය පදනම් කොට ගනිමින් ඔවුන්ගේ සේවය වසර 6ක් පිරෙන දින සිට එම තනතුරෙහි දෙවන ශ්‍රේණියට උසස්කිරීමක් සිදුකළ බවත්දන්වා ඇත.

පැමිණිලිකරු 2009 වසරේදී ආයතනය තුළ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරට පත්වීම් ලබා ඇති බැවින් ඔහු ඉහත සම්මුඛ පරීක්ෂණයට නොකැඳවූ බවත්, පැමිණිලිකරු ඒ වන විටත් ආයතනය තුළ උසස්වීම් ලබා ඇති බවට පාලක මණ්ඩලය තීරණය කර ඇති බවත් වැඩිදුරටත් දන්වා ඇත.

**කොමිෂන් සභාව හමුවේ අනාවරණය වී ඇති කරුණු:-**

පැමිණිල්ලට අදාළව දෙපාර්ශවයේම කරුණු දැක්වීම මත කොමිෂන් සභාව හමුවේ සිදු කරන ලද පරීක්ෂණයේදී පහත කරුණු අනාවරණය වී ඇත.

පැමිණිලිකරු 2001 වසරේදී වගඋත්තරකාර ආයතනයේ විද්‍යාල උපදේශක තනතුරට පත්වී 2009 දක්වා අඛණ්ඩව එකම තනතුරෙහි කිසිඳු උසස්වීමක් හෝ ශ්‍රේණිගත කිරීමක් නොමැතිව දීර්ඝකාලීනව තම රාජකාරි ඉටුකොට ඇති බවත්, 2009 වසරේදී ආයතනය තුළ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරට සුදුස්සෙකු පත්

කොට ගැනීම සඳහා පොදුවේ පළකොට තිබූ දැන්වීමකට අනුව පැමිණිලිකරුද තම අයදුම්පත්‍රය යොමුකොට අදාළ සම්මුඛ පරීක්ෂණයට මුහුණ දී අවශ්‍ය සියළු සුදුසුකම් සපුරා තිබීම යන කාරණය මත නියෝජ්‍ය අධ්යක්ෂ තනතුරට පත්වීම් ලබා ඇති බවත්, අනාවරණය වේ. මෙම නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර අයතනය තුළ පැමිණිලිකරු ලැබූ කිසිදු උසස්වීමක් නොවන අතර, නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර සඳහා ආයතනයෙහි අභ්‍යන්තර අයදුම්පත් කැඳවා කරන ලද පත්වීමක්ද නොවන බවත්, අභ්‍යන්තර හා බාහිර සියළු අයදුම්කරුවන්ට අයදුම් කළ හැකි ආකාරයෙන් අදාළ දැනුම්දීම් සිදුකොට තිබූ බවත් වැඩිදුරටත් අනාවරණය වී ඇත.

ඒ අනුව පැමිණිලිකරු විද්‍යාල උපදේශක තනතුර දරණ ලද වෙනත් නිලධාරීන්ගෙන් වෙනස් කොට සැලකීමක් සිදුකළ යුතු තත්ත්වයට පත්වී නොමැති අතර, එකම කාල වකවානුව තුළ එකම තනතුරෙහි සියළු විද්‍යාල උපදේශකවරුන් සමඟ පැමිණිලිකරු ද සමාන තලයෙහි නිලධාරියෙකු බව වැඩිදුරටත් අනාවරණය වේ. ඒ අනුව පවතින තත්ත්වය හා නෛතික වටපිටාව කොමිෂන් සභාව හමුවේ පවත්වන ලද පරීක්ෂණය තුළදී වගඋත්තරකරුවන්ට පහදා දී ඇති බව ගොනුව අනුව නිරීක්ෂණය වේ. එකී පැහැදිලි කිරිම් වලට අනුව වගඋත්තරකරුවන් පැමිණිලිකරු සම්බන්ධයෙන් ද අදාළ පොදු සහනය ක්‍රියාත්මක කළ යුතු බව අවබෝධ කොට ගැනීමෙන් පසු මේ වනවිට පැමිණිලිකරු පත්වී සිටින නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර කිසිදු උසස්වීමක් නොවන නිසාත් එය නව පත්වීමක් වන නිසාත් 2001 වසරේ සිට විද්‍යාල උපදේශක තනතුරෙහි පැමිණිලිකරු දීර්ග කාලීනව කිසිදු උසස්වීමක් නොලබා සේවය කිරිම හේතුවෙන් ඔහුව ද පොදුවේ ශ්‍රේණිගත කොට පෙරදාතම් කිරීම සිදුකළ යුතු බවට අධ්‍යක්ෂ පරිපාලන විසින් පාලක මණ්ඩලය වෙත අදාළ නිර්දේශ වාර්ථාව ඉදිරිපත් කොට ඇති බව ද අනාවරණය වී ඇත.

නමුත් කොමිෂන් සභාව හමුවේ වැඩිදුර පරීක්ෂණ පවත්වන ලද 2012.10.02 දින දක්වාම ඉහත අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවට පාලක මණ්ඩල අනුමැතිය ලැබී නොමැති බව කොමිෂන් සභාවට වගඋත්තරකරු වෙනුවෙන් පෙනීසිටින ලද නිලධාරියා වෙනුවෙන් කරුණු ඉදිරිපත් කරමින් අනාවරණය කර ඇත.

කෙසේ වෙතත්, පැමිණිලිකරු 2001 වර්ෂයේ සිට දීර්ග කාලයක් පුරාවට අනිකුත් සියළු විද්‍යාල උපදේශකවරුන් සේම කිසිදු උසස්වීමක් හෝ ශ්‍රේණිගත කිරිමකින් තොරව ආයතනයට සේවය කොට ඇති බව තහවුරු වීම තුළින් 2009 වසරේදී වගඋත්තරකාර ආයතනයෙහිම නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරකට අයදුම්පත්‍ර යොමුකොට සිය සුදුසුකම් මත නව පත්වීමක් ලබා ඇති බවත්, එකී පත්වීම කිසිදු ලෙසකින් පැමිණිලිකරු දැරූ පැරණි තනතුර වන විද්‍යාල උපදේශක තනතුර සඳහා ඇති උසස්වීමක් නොවන බව තහවුරු වී ඇති නිසාත්, අනික් සියළු විද්‍යාල උපදේශකවරුන් සම්බන්ධයෙන් ක්‍රියාත්මක කොට ඇති පොදු සහනශීලී වැඩ පිළිවෙල පැමිණිලිකරු සම්බන්ධයෙන් ද ක්‍රියාත්මක කිරිම් සිදු කළ යුතු බව තහවුරු වී ඇත. එනම් සෙසු විද්‍යාල උපදේශක නිලධාරීන් වෙනුවෙන් ක්‍රියාත්මක

කොට ඇති ශ්‍රේණිගත කිරීමේ ක්‍රියාවලිය තුළ පැමිණිලිකරුද ශ්‍රේණිගත කිරීම පැමිණිලිකරු සතු මූලික අයිතිවාසිකමක් බවට තහවුරු වී ඇති අතර, පැමිණිලිකරු සම්බන්ධයෙන් එකී නොකර හැරීම තුළින් පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීමට අත්‍යාසන්නව පවතින බව නිරීක්ෂණය වී ඇත. නමුත් වගඋත්තරකරුවන් විසින් ඒ වන විටත් පැමිණිලිකරුට වාසි සහගත වන ආකාරයෙන් පාලක මණ්ඩලය වෙත අදාල නිර්දෙශයන් යොමුකොට තිබීම යම් සුභවාදීභාවයක් අනාවරණය කොට ඇති නමුත් පාලක මණ්ඩලය එතෙක් පැමිණිලිකරු වෙනුවෙන් ඉදිරිපත් වී ඇති නිර්දෙශයන් අනුමත නොකිරීම තුළින් තවදුරටත් පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් අවදානම් තත්ත්වයකට පත් කොට ඇති බව නිරීක්ෂණය වේ.

විශේෂයෙන්ම ඉහත කාරණය හා සලකා බැලීමේදී, මේ වන විට පැමිණිලිකරු වගඋත්තරකාර ආයතනයේ පිළිගත යුතු ඉහළ තනතුරක් දැරුවද එකී නව තනතුර ලබා ගැනීම හා දැරූ පැරණි තනතුර අතර පැහැදිලිවම එක්ව ගතහැකි සම්බන්ධතාවයක් නොපෙන්වන බවත්, වෙනස් කාරණයක් වන බවත් විද්‍යාල උපදේශක තනතුර තුල දීර්ග කාලයක් කිසිඳු උසස්වීමක් නොමැතිව රාජකාරී කිරීම තුළින් සේවකයෙකු ලෙස පැමිණිලිකරු මුහුණපා ඇති දුෂ්කරතාවයන්ට කිසිඳු සහනශීලී බවක් ඒ තුළින් සැලසී නොමැති බවත්, ඔහුද අනෙකුත් විද්‍යාල උපදේශකවරුන් මෙන්ම එකම කාලසීමාවක් තුළ එකම රාජකාරී පරාසයක් තුළ එකම දුෂ්කරතාවයන්ට මුහුණ පා ඇති බවත්, එකී ගෙවුන කාලසීමාව සම්බන්ධයෙන් අනෙක් විද්‍යාල උපදේශකවරුන්ට 2010 වසරේදී පොදු සහනශීලී විසඳුමක් ලබාදී ඇති නමුත්, 2009 වසරේදී එකම ආයතනයේ වෙනත් තනතුරක් ලැබීම හේතුවෙන් පැමිණිලිකරුට පමණක් ඉහත සහනශීලී විසඳුම අහිමි වී ගොස් ඇති බව අනාවරණය වී ඇත.

මේ හේතුවෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මඟින් සහතික කොට දී ඇති පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

ඒ අනුව, වගඋත්තරකරුවන්ගේ ක්‍රියාකලාපය හේතුවෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මඟින් සහතික කොට දී ඇති පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට අනාවරණය වී තිබීම මත, ඉහත කී අනෙක් විද්‍යාල උපදේශකවරුන් සේම පැමිණිලිකරුද 2000 වසරේ සිට 09කට අධික කාලයක් මුල් පත්වීම ලැබූ තනතුරේම කිසිඳු උසස්වීමක් හෝ නොමැතිව ආයතනයට රාජකාරී කිරීම හේතුවෙන් සියළුම විද්‍යාල උපදේශකවරුන් වෙනුවෙන් 2006 වර්ෂය වන තෙක් පසුදාතම කොට ලබා දී ඇති පොදු සහනය

යටතේ, නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර ලබන 2009 අප්‍රේල් මස දක්වා ඊට හිමි මූල්‍යමය සහන ලබාගැනීමට, පැමිණිලිකරුටද සම්පූර්ණ හිමිකමක් පවතින බැවින්, අදාළ මූලයමය සහන සලසාදීමට වගඋත්තරකරුවන් විසින් පියවර ගත යුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2023.01.23 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්ති ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර , එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේනම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

අනුසුයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

මා.හේ. නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :- අමාත්‍යතුමා,
යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය,
15, කාක දූපත,
මට්ටක්කුලිය.

B/-